අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/58/20/ජාතිකපාසල්-SLPS

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2022. 03-10

නම

සම්මුඛ පරීක්ෂණ අංකය

<u>ජාතික පාසල්වල පුරප්පාඩු වී ඇති විදුහල්පති තනතුරු සඳහා නිලධාරීන් තෝරා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම - ශ්‍රී ලංකා විදුහල්පති සේවය I</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි දිවයින පුරා පිහිටි ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ නිළධාරියෙකු විදුහල්පති ධූරය දැරිය යුතු ජාතික පාසල් 43 ක විදුහල්පති පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා ඔබ කැඳවනු ලබන බව සතුටින් දන්වා සිටිමි.

02 ඒ සඳහා ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ 04 වන මහල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාවට අයත් රැස්වීම් ශාලාවට.............................. දින පෙ.ව./ප.ව. ..........................ට පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි. එදිනට පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් හා එම ලේඛනයන්හී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ විදුහල්පති විසින් සහතික කරන ලද ඡායා පිටපත් (අංක I සිට VII දක්වා ලේඛන) ගොනුවක් පහත සඳහන් අනුපිළිවෙලට සකස් කර ඔබගේ නම හා සම්මුඛ පරීක්ෂණ අංකය සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

I. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපිය
II. ජාතික හැදුනුම්පත
III. නමෙහි වෙනසක් පවතී නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශය (නමෙහි වෙනසක් පවතී නම් පමණක්)
IV. සේවා පළපුරුද්ද සනාථ කිරීම සඳහා
   a) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණි උසස්වීමේ ලිපිය/ අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය/ පත්වීමේ ලිපිය (උසස්වීම් ලිපිය ලබා නොමැති නම් ඒ සඳහා සියලුම සුදුසුකම් සපුරා ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව)
   b) ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත් වූ දින සිට 2021.10.12 දින දක්වා ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන සේවය පිළිබඳ සහතිකය ( ආකෘති පත්‍ර අංක 01)

V. අධ්‍යාපන සුදුසුකම් - අනු අංක 02 යටතේ ද

VI. සේවා ඇගයීම අනු අංක 05 යටතේ ද
VII. අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන අනු අංක 06 යටතේ ද
   a) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ලකුණු පටිපාටියේ අංක 6 යටතේ ඔබ විසින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අධ්‍යාපන පර්යේෂණ හා ප්‍රකාශන වල සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කිරීමේදී එම පර්යේෂණ/ප්‍රකාශනය කුමක්ද යන්න පැහැදිලිව දක්වා ඇති පිටුව/පිටු එම ප්‍රකාශනයන් කෘති/ප්‍රකාශන ලෙස ඔබගේ නම සඳහන් වන පිටුව/පිටු වල සහතික කරන ලද පිටපත් සමඟ අදාල පර්යේෂණ හා ප්‍රකාශන වල මුල් පිටපත් ඉදිරිපත් කල යුතුය.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

03. ලකුණු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනයන්හි දකුණු පස ඉහල කෙලවර ලකුණු පටිපාටියේ කුමන අනු අංකය යටතේ ලකුණු ලබා ගැනීමට ඉදිරිපත් කරන්නේද යන්න සඳහන් කර තිබිය යුතුය.

උදා - අධ්‍යාපන සුදුසුකම් සඳහා ඉදිරිපත් කරනු ලබන සහතික - අනු අංක 02

ඒ අනුව ඡායා පිටපත් ගොනුව සැකසීමෙන් පසු මේ සමග අමුණා ඇති ආකෘති පත්‍ර අංක 02 සම්පූර්ණ කර ගොනුව සමග සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය. ප්‍රසිද්ධ කර ඇති ලකුණු පටිපාටියේ දක්වා ඇති 'සටහන්' කෙරෙහි මනා අවධානයෙන් යුක්තව ලේඛන ඉදිරිපත් කල යුතුය.

04. මෙම සම්මුඛ පරීක්ෂණයේදී ඔබ දක්වනු ලබන කාර්ය සාධනය හා ඔබගේ අධ්‍යාපන සුදුසුකම් අනුව උපයාගනු ලබන ලකුණු මත ලබා ගන්නා සමස්ත කුසලතාවයේ ප්‍රමුඛතාවය අනුව පමණක් විදුහල්පති තනතුරු පුරප්පාඩු වී ඇති ජාතික පාසලක විදුහල්පති තනතුරකට පත් කරනු ලැබීම සිදු වේ.

05. අයදුම්කරුවන් අදාළ අයදුම්පත්‍රයේ මනාපය පළකරන ලද ඕනෑම ජාතික පාසලක විදුහල්පති තනතුරකට පත්වීම් ලදහොත් අනිවාර්යයෙන්ම එම තනතුරෙහි රාජකාරී භාරගත යුතු බවත්, පසුව අයදුම්පත්‍රයේ මනාපය වෙනස් කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් සළකා නොලබන බවත්, වැඩිදුරටත් දන්වමි.

06. සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පමණක් පුරප්පාඩු වී ඇති ජාතික පාසලක විදුහල්පති තනතුරක් ලබා ගැනීම සඳහා හිමිකමක් නොවන බවද, දැනට පුරප්පාඩු වී ඇති ජාතික පාසල් විදුහල්පති තනතුරු සියල්ල සඳහාම නිලධාරීන් පත් කිරීමේ හෝ තනතුරු කිහිපයක් සඳහා පමණක් නිලධාරීන් පත් කිරීමේ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සතු වන බව ද, වැඩිදුරටත් අවධාරණය කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
අතිරේක ලේකම්
(අධ්‍යාපන සේවා ආයතන)
අධ්‍යාපන ලේකම් වෙනුවට

**අවධානයට:** ඔබ නියමිත දින සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම අනිවාර්යය බව ද සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමේදී ඉහත සඳහන් ලිපි ලේඛන සියල්ලම නිවැරදි ලෙස රැගෙන පැමිණිය යුතු බවද සම්මුඛ පරීක්ෂණ අවස්ථාවෙන් පසුව කිසිදු හේතුවක් මත කිසිදු ලේඛනයක් සුදුසුකම් සනාථ කිරීම සඳහා භාර නොගන්නා බව ද තවදුරටත් අවධාරණය කරමි.

ආකෘති පත්‍ර අංක 01

**ජාතික පාසල්වල පුරප්පාඩු වී ඇති විදුහල්පති තනතුරු සඳහා නිලධාරීන් තෝරා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම - ශ්‍රී ලංකා විදුහල්පති සේවය I ශ්‍රේණිය**

I කොටස - ( I ශ්‍රේණියට උසස් වූ නිලධාරීන් සඳහා )

.......................................................................................අමාත්‍යාංශයේ/විද්‍යාලයේ/කලාප අධ්‍යාපන කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/අංශයේ සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධාරී ........................................................................... මහතා / මහත්මිය සම්බන්ධව 2021.10.12 දිනට සතුටුදායක සේවා කාලය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

I. ශ්‍රී.ලං.වි.සේ. මුල් පත්වීම් දිනය : ........................................
II. ශ්‍රී.ලං.වි.සේ. මුල් පත්වීම ස්ථිර කරන ලද දිනය :........................................
III. II ශ්‍රේණියට උසස් වූ දිනය : ........................................
IV. I ශ්‍රේණියට උසස් වූ දිනය : ........................................
V. I ශ්‍රේණියේ සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇත / නැත

| වර්ෂය | කාලය | වැටුප් රහිත නිවාඩු |
|---|---|---|
| | ......................... සිට ......................... දක්වා | අවු ......... මාස ......... දින ......... |
| | ......................... සිට ......................... දක්වා | අවු ......... මාස ......... දින ......... |
| | ......................... සිට ......................... දක්වා | අවු ......... මාස ......... දින ......... |

VI. නියමිත දිනට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වී ඇත / නැත
VII. I ශ්‍රේණියේ සේවා කාලය තුළ දී වැටුප් වර්ධක උපයාගෙන ඇත / නැත
VIII. වැටුප් වර්ධක විලම්බනය කර ඇත්නම් එසේ කිරීමට හේතු

| වැටුප් වර්ධක විලම්බනය | හේතුව |
|---|---|
| ...................... සිට ...................... දක්වා | |
| ...................... සිට ...................... දක්වා | |

IX. දැනට පවත්නා හෝ ඉදිරියට ආරම්භ කිරීමට නියමිත විනය, විගණන හෝ විමර්ශන කටයුතු ඇත / නැත
X. එසේ විනය, විගණන හෝ විමර්ශන ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු

| වර්ෂය | විනය/විගණන/විමර්ශන ද යන වග | 2021.10.12 දිනට තත්ත්වය |
|---|---|---|
| | | |
| | | |
| | | |

ඉහත සඳහන් කර ඇති තොරතුරු මෙම නිලධාරියාගේ/නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවට සහතික කරමි.

දිනය : ........................ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/දෙපාර්තමේන්තු ප්‍රධානියා : ...................................

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය" බත්තරමුල්ල

(අත්සන හා නිල මුද්‍රාව)

II කොටස - ( I ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් සපුරා ඇති නමුදු මෙතෙක් උසස් වීම් නොලද නිලධාරීන් සඳහා )

..........................................................................................අමාත්‍යාංශයේ/විද්‍යාලයේ/කලාප අධ්‍යාපන කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ අංශයේ සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II ශ්‍රේණියේ නිලධාරි/(I ශ්‍රේණියට උසස්වීමට සුදුසුකම් සපුරා ඇති)............................................................................ මහතා/ මහත්මිය සම්බන්ධව 2021.10.12 දිනට සතුටුදායක සේවා කාලය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

I. ශ්‍රී.ලං.වි.සේ. මුල් පත්වීම් දිනය : ..............................................
II. ශ්‍රී.ලං.වි.සේ. මුල් පත්වීම ස්ථිර කරන ලද දිනය ..............................................
III. 11 ශ්‍රේණියට උසස් වූ දිනය : ..............................................
IV. 1 ශ්‍රේණියට උසස්වීමට සුදුසුකම් සපුරා ඇති දිනය : ..............................................
V. 11 ශ්‍රේණියේ පූර්වාසන්න වසර 5ක සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇත / නැත

| වර්ෂය | කාලය | වැටුප් රහිත නිවාඩු |
|---|---|---|
| | ......................... සිට ......................... දක්වා | අවු ......... මාස ......... දින ......... |
| | ......................... සිට ......................... දක්වා | අවු ......... මාස ......... දින ......... |
| | ......................... සිට ......................... දක්වා | අවු ......... මාස ......... දින ......... |

VI. නියමිත දිනට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වී ඇත / නැත
VII. 11 ශ්‍රේණියේ පූර්වාසන්න වසර 5ක සේවා කාලය තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇත / නැත
VIII. වැටුප් වර්ධක විලම්බනය කර ඇත්නම් එසේ කිරීමට හේතු

| වැටුප් වර්ධක විලම්බනය | හේතුව |
|---|---|
| ...................... සිට ...................... දක්වා | |
| ...................... සිට ...................... දක්වා | |

IX. දැනට පවත්නා හෝ ඉදිරියට ආරම්භ කිරීමට නියමිත විනය, විගණන හෝ විමර්ශන කටයුතු ඇත / නැත
X. එසේ විනය, විගණන හෝ විමර්ශන ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු

| වර්ෂය | විනය/විගණන/විමර්ශන ද යන වග | 2021.10.12 දිනට තත්ත්වය |
|---|---|---|
| | | |
| | | |
| | | |

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය" බත්තරමුල්ල

XI. අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාවේ සහ අංක 2004/59 හා 2017.02.02 දිනැති සේවා ව්‍යවස්ථා සංශෝධනයෙහි විධිවිධාන අනුව ............................ දිනට 1 ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත / 1 ශ්‍රේණියට උසස්වීම සඳහා සියළුම සුදුසුකම් සම්පූර්ණ කර ඇත.

ඉහත සඳහන් කර ඇති තොරතුරු මෙම නිලධාරියාගේ/නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් 2021.10.12 දිනට වසර ..................... සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත් සහතික කරමි.

දිනය : ........................ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/දෙපාර්තමේන්තු ප්‍රධානියා : ................................

(අත්සන හා නිල මුද්‍රාව)

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය" බත්තරමුල්ල

ආකෘති පත්‍ර අංක 02

ජාතික පාසල් විදුහල්පති තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන්
තෝරා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණය
(ශ්‍රී.ලං.අ.ප.සේ I / ශ්‍රී.ලං.අ.ප.සේ. II/III / ශ්‍රී ලං. වි.සේ. I)

| අනු අංකය | සහතික | ඡායා පිටපත් ගොනුවේ ලිපි අංක<br>....... සිට ........ දක්වා * |
|---|---|---|
| 01 | ලකුණු පටිපාටියේ මූලික සුදුසුකම් සඳහා වූ සහතිකපත් | |
| 02 | ලකුණු පටිපාටියේ අනු අංක 01 යටතේ වන සහතිකපත් | |
| 03 | ලකුණු පටිපාටියේ අනු අංක 02 යටතේ වන සහතිකපත් | |
| 04 | ලකුණු පටිපාටියේ අනු අංක 05 සඳහා වන සහතිකපත් | |
| 05 | ලකුණු පටිපාටියේ අනු අංක 06 සඳහා වන සහතිකපත් | |

පිටු අංක.......... සිට........... දක්වා වූ ඡායා පිටපත් ගොනුව ඉදිරිපත් කරමි.

............................................

අයදුම්කරුගේ අත්සන

දිනය -

*ඡායා පිටපත් ගොනුවේ පිටු රතු පැහැයෙන් අංක කරන්න.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය" බත්තරමුල්ල